චක්‍රලේඛ අංක :01/2015

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2015. 01. 12

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල, ස.ණ.ස. සමිති සහ
ස.ණ.ස. සංගම්වල සභාපතිවරුන් වෙත.

## <u>සමුපකාර සේවකයින් සඳහා 2015 වර්ෂයේ නිවාඩු.</u>

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාව අනුව සමුපකාර සේවකයින්ට හිමිකම් ඇති ප්‍රසිද්ධ නිවාඩු වූ කලී සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පමුණුවන ලද දිනයන්ම වේ. මේ අනුව පහත සඳහන් දිනයන් සමුපකාර සේවකයින් සඳහා නිවාඩු දින වශයෙන් කොමිෂන් සභා නියමය පරිදි දන්වමි.

| | | | |
|---|---|---|---|
| 1.) | ජනවාරි | - 04 | මිලාදුන් නබිනායක තුමාගේ උපන් දිනය. |
| 2.) | ජනවාරි | - 15 | දෙමළ තෛපොංගල් දිනය. |
| 3.) | පෙබරවාරි | - 04 | ජාතික දිනය. |
| 4.) | අප්‍රේල් | - 13 | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනට පෙර දිනය. |
| 5.) | අප්‍රේල් | - 14 | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය. |
| 6.) | මැයි | - 01 | මැයි දිනය. |
| 7.) | මැයි | - 04 | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය. |
| 8.) | දෙසැම්බර් | - 25 | නත්තල් උත්සව දිනය. |

02. ඉහත සඳහන් දිනයන්ට අමතරව සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සමුපකාරකයින්ගේ දිනය ද නිවාඩු වශයෙන් දිය යුතුය. තව ද මීට අමතරව රජය විසින් අවස්ථාවෝචිත පරිදි "රජයේ නිවාඩු" දිනයන් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන දිනයන් සඳහා සිය සේවකයින් සඳහා නිවාඩු දෙන ලෙස ඉල්ලීමක් කළහොත් එවැනි අවස්ථාවල සමුපකාර සමිතිවලට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි තම සේවකයින්ට නිවාඩු දීම පිළිබඳ තීරණය කළ හැකිය. 2015 වර්ෂය සඳහා සිංහල/දෙමළ අවුරුද්දට පෙර දිනය නිවාඩු වශයෙන් යොදා ගෙන ඇති බැවින් පාරිභෝගිකයින්ගේ පහසුව තකා යම් සමිතියක් කැමැත්තේ නම් සමිති කාර්යාලය හෝ ප්‍රාදේශිකයන් මේ දිනවල එක් දිනයක් හෝ දින දෙකම විවෘතව තැබීමටත්, එම දිනවල වැඩ කිරීම සඳහා සේවකයින්ට උපදෙස් දීමටත් කොමිෂන් සභාවේ අනුමැතිය ලැබේ. එසේ ක්‍රියා කරනු ලැබූ විට දී ඉහත සඳහන් පරිදි සේවයේ යොදා ගත් සේවකයින්ට එසේ සේවයේ යොදා ගත් දින ගණනට සමාන දින ගණනක් සම්පූර්ණයෙන්ම වැටුප් සහිතව ඊළඟට එන දින 30 ඇතුලත දී සේවකයින්ට නිවාඩු ලබා දිය යුතුය. මෙසේ සමිති කාර්යාලයක්, සමිති ප්‍රාදේශිකයක් විවෘතව තබන අවස්ථාවේදී සේවයේ යෙදවීමට උපදෙස් දෙනු ලැබුවේ මුළු සේවක සංඛ්‍යාවම වුවත් නොපමාව ඒ බැව් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.

03. ඉහත දැක්වූ නිවාඩු දිනවලින් කිසිවක් සමිතියේ සතිපතා දෙන නිවාඩු 1 ½ ට ඇතුළත් වුවහොත් ඒ වෙනුවෙන් පිළිවෙලින් අඩ දිනක් හෝ සම්පූර්ණ දිනක් නිවාඩු වශයෙන් ඊළඟට එන දින 30 ඇතුළත දී සේවකයන්ට නිවාඩු වශයෙන් ලබා දිය යුතුය. මීට විකල්පයක් වශයෙන් දෙපක්ෂයේ එකඟතාව ඇතිව ඒ වෙනුවට දින භාගයක් හෝ එක් දිනක වැටුප හෝ අවස්ථාවෝචිත පරිදි ගෙවීම් කළ හැකි වේ.

එච්.පී.එම්.ජී.ආර්.ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 1. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්
2. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, ආහාර සැපයීම් හා බෙදාහැරීම්, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යාංශය
3. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
4. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, බස්නාහිර පළාත.
5. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව
6. සියළුම පළාත් සමුපකාර කොමිෂන් සභා ලේකම්වරුන්
7. සියළුම වෘත්තීය සමිති සංගම්